# 21 ජලචර මානවයාගේ දවසක්


**ප්‍රවීණ සෝවියට් විද්‍යා ලේඛක ඇලෙක්සැන්දර් බෙලායෙෆ්ගේ 'උභය ජීවී මිනිසා' නම් වූ විද්‍යාත්මක නවකතාවෙන් උපුටාගත් කොටසක් මේ පාඩමට ඇතුළත් වෙයි. ඉහත කෘතිය සිංහලයට නඟනු ලැබුවේ කෘතහස්ත අනුවාදකයකු ව සිටි ජේ. ඊ. ගුණසේකර මහතා විසිනි.**

දැන් අලුයම් කාලයයි. වායුව අලුයම පිපෙන මල් සුවඳින් පිරී ඇත. සියල්ල නිසල ය. කොළයක සෙලවීමකදු නො ඇසෙයි. වැල්ලෙහි පිය ඔබා යන විට නැඟෙන කුරුකුරුව පමණක් නිහැඬියාව තුළින් ඇසෙයි. පියවරක් පාසා ඔහු හිණ බැඳි සම්පටියේ එල්ලෙන පිහිය, පිහිනුම් උපැස් යුවල, අත් වැසුම් යුවල සහ පිහිනුම් පාවහන් යුවල ලතාවකට සැලෙයි. පැහැදිලි ව නො පෙනෙන තුරු පඳුරු අතරින් වැටුණු මාවත ඔස්සෙ මේ යන්නේ උභය ජීවි ඉක්තියැන්දර් ය. හේ වරින්වර ගසක අත්තක් අල්ලා සොලවයි. ඉන් වැහෙන පිනි පොදින් ඔහුගේ හිසත්, තාමත් නින්දේ උණුසුම නො ගිය කොපුලත් තෙමෙයි.

මඟ දකුණට නැඹුරු වෙයි. බෑස්ම වැඩි වෙයි. වායුවේ තෙතමනය ද වැඩි වෙයි. පිනි බෑ පෙතැලි ගල්වල තෙත ඉක්තියැන්දර්ගේ පයට දැනෙයි. හේ නැවතී සිය පිහිනුම් ඇඳුම් කට්ටලය නිවීහැනහිල්ලේ ඇඳගනී. දීර්ඝ ප්‍රශ්වාසයකින් සිය පෙනහැලි පුරා ඇති වායුව මුළුමනින් පිටකරන හෙතෙම පිහිනුම් තටාකයට පනී. සිරුර පණ ගන්වන සුලු සීතල ජලය කරමල් අතරින් යන විට ඒවාට කිතියක් දැනෙයි. දැන් කරමල් ළයාන්විත ව සැලෙයි. මිනිසා මත්ස්‍යයකු බවට පත්වෙයි.

බලවත් වෙර ගැනුම් කිහිපයකින් ඉක්තියැන්දර් තටාකයේ පතුලටත්, ඒ ඔස්සේ මඳක් ඉදිරියටත් යයි. දෙ පසට විහිදූ ඔහුගේ අත්වලට ගල් බිත්තියට කාවැද්දූ යකඩ අල්ලු එකින් එක අසු වෙයි. හෙතෙම ඒ අනුව ගොස් උමඟට ඇතුළු වෙයි. පිහිනුම් තටාකය තුළට මුහුදින් සීතල වතුර ගෙන එන සිහිල් දිය වැලට එරෙහි ව හේ කොන්ද නමාගෙන ඉදිරියට යයි. මඳ දුරක් යන හේ පය බිමට තෙරපා ඉහළ නගී. තමා උණුසුම් දිය බඳුනකට ඇතුළු වුණු සෙයක් ඔහුට දැනෙයි. ඒ පොකුණුවලින් පිට වී මුහුදට ගලාගෙන යන වතුර පාර ය. උඩුකුරු ව බැවී දෑත් හකුළාගෙන හිස පෙරටුව යන සේ තමා මුහුදු කරා ගෙන යාම දියවැලට පවරා තෙමේ නිසල ව සිටී.

හේ උමං දොරට වඩාත් කිට්ටු වෙයි. දිය පාර මුහුදට වදින විට විසි වන ගල් කැට සහ සිප්පි කටුවලින් නැගෙන සර සරය ඔහුට ඇසෙයි. තව ම අඳුර දැඩි ය. අඳුරේ අත් ඉදිරියට විහිදන ඔහුට යකඩ ග්‍රීලය අසු වෙයි. යපොලුවල දිය සෙවෙල් සහ පාසි



බැඳී ඇත. හෙතෙම අවුල් සැකැස්මකින් යුතු ඉබියතුරු තහඩුව මඳ වෙලාවක් අත පත ගායි.

ග්‍රීලය මැද පිහිටි රවුම් දොර සෙමෙන් ඇරෙයි. ඉක්තියැන්දර් ඇරුණු දොරින් රිංගා මහ සයුරට පිවිසෙයි. දොර ඉබේ වැසී ටික් හඬින් අගුළු වැටෙයි.

තව ම දිය යට අඳුරු ය. වඩාත් අඳුරු ගැඹුරෙහි හැසිරෙන ඇතැම් මුහුදු ජීවීන්ගේ ලෙළදෙන නිලට හුරු එළිත් දිස්වෙයි. එහෙත් අරුණ ළඟා වත් ම මුහුදෙහි වෙසෙන සිය පබායෙන් දිලෙන සත්තු සිය සිඟිති පහන් එකිනෙක නිවා දමති.

ඉක්තියැන්දර්ට ශ්වසනයේ මඳ අපහසුවක් දැනෙයි. ඔහුගේ කරමල්වල මඳ රිදුමක් ඇති වෙයි. මේ ගඟක බොර දිය මුහුදට වදින ඉසව්වකට ඔහු පැමිණ ඇති බවට ලකුණු ය. ගංගාවන්හි පල්වතුරේ ජීවත් වන මිරිදිය මසුන් හුස්ම ගන්නේ කෙසේ දැයි ඔහු පුදුමයට පත් වෙයි. ඔවුනට දැඩි කරමල් තිබෙනු විය යුතු ය.

වෙරළට සමාන්තර ව උතුරු දිගට ගලන පිරිසිදු ජලයෙන් යුතු සීත දිය වැල හමු වන තුරු ඉක්තියැන්දර් පහත බසී. එය හමු වූ පසු හේ දිය වැල නැගෙනහිරට බර වෙන තැන දක්වා යයි.

ගඟේ පහළ තට්ටුව ගලා යන්නේ බොහෝ ගැඹුරිනි. එහෙත් ඉක්තියැන්දර්ගේ සුපුරුදු වාහකය වන ඉහළ තට්ටුව මුහුදේ මතු තලයට වඩා අඩි පනහක් පමණ ගැඹුරින් ගලා බසී. දැන් ඔහුට එහි විවේකය ගන්නට හැකි ය. පැහැදිලි ජලය සහිත ප්‍රවාහය ඔහු සයුරේ ඈත දියඹට ගෙන යයි.

තව ම අඳුර මුළුමනින් පහව ගොස් නැත. තව ම මාංශ භක්ෂක චණ්ඩ මත්ස්‍යයන් උඩට පැමිණ නැත. එහෙයින් දැන් ඔහුට සැප නින්දක් නිදත හැකි ය. අරුණ නැගෙන වේලෙහි නිදන නින්ද මිහිරිතම වෙයි.

ඔහු නිදද්දී ශීතෝෂ්ණයේ සහ පීඩනයේ ඇති වන කුඩු මහත් හැම වෙනසක් ම ඔහුගේ සම විසින් සටහන් කරගනු ලැබෙයි. ඔහුගේ කන සෑම ශබ්දයක් ම අල්ලා ගනී. ඉතා ඈතින් එන දෝංකාර දෙන සිහින් ශබ්ද පිට පිට ඇසෙයි. මේ සැතැපුම් කීපයක් ඈතින් පිහිටි වරායක නවතා තිබූ රුවල් නැව් උදෑසන මුහුදු යන්නට සැරසී නැංගුරම් ඔසවන විට දම්වැල්වලින් එන හඬ ය.

මඳ වෙලාවකට පසු මේ හැම හඬක් ම යටපත් කරමින් බලවත් ගිගුරුම් හඬක් ඈතින් ඇසෙයි. ඒ 'හොරොක්ස්' නමැති සුබෝපභෝගී මහා ධූම නෞකාවේ යන්ත්‍ර

ක්‍රියා කිරීමේ දී නැගෙන හඬ ය. හොරොක්ස් බ්‍රිතාන්‍ය දුම් නැවකි. එය බුවනොස් අයර්ස් සහ ලිවර්පූල් අතර මගීන් ප්‍රවාහනය කරයි. දුම් නැව තවම සැතපුම් විස්සක් පමණ ඈත ය. එහෙත් මුහුදු ජලයේ මිනිත්තුවට සැතපුම් පනහක පමණ වේගයෙන් ගමන් කරන ශබ්ද තරංග ග්‍රහණයට එය බාධාවක් නො වේ. රෑට හොරොක්සය පාවෙන මාලිගාවක් වැනි දකුම්කලු දර්ශනයකි. එහෙත් එය රෑ කාලයේ දී දක ගැනීමට නම් ඉක්තියැන්දර් හැන්දෑවේ පිටත් ව ආ යුතු ය. උදේට විදුලි පහන් සියල්ල නිවා බුවනෝස් අයර්ස් වරායෙහි නවතා ඇත්තේ වෙනස් හොරොක්සයකි. දැන් සයිරන පිඹිමින් සිටින එය තව නොබෝ වෙලාවකින් සිය යන්ත්‍රවල නාදයෙන් සමුද්‍ර වාසී සියල්ලන් අවදි කරවනු ඇත. මොහොතකට පෙර ඔහුට දැනුණ ක්ෂුද්‍ර පීඩනය දුම් නැවේ ළඟා වීමට පෙර නගින ඩොල්පිනයන් නිසා ඇති වූවකි. ඔවුන් දුම් නැව හමුවීම සඳහා දැනට ම පිටත් ව යනු විය යුතු ය.

වරාය සහ මුහුදු බොක්ක පණ ගැහීගෙන එයි. යන්ත්‍රවල නාදය ඉක්තියැන්දර්ට වඩාත් නුදුරු ව ඇසෙයි. හේ ඇස් හැර නිදි මත පලවා හරින්නට හිස සලා උඩට මතු වී අවට පිරික්සා බලයි. අසල ඔරු පාරු ආදියක නැති හෙයින් හේ නිදහස් ලෙස මුහුදේ ඔබ මොබ සරයි.

මුහුදු ළිහිණියෝ පියාපත් නො සලා පා වී අවුත් ඔප නැගූ කැඩපතක් බඳු ජල තලයෙහි සිය උර තල ගාවා යළි ඉගිලී යති. සුදෝසුදු මුහුදු ළිහිණියන්ගේ රාවය අත දරුවන්ගේ කෑගැසීම වැන්න. හිම මෙන් සුදු පැහැති අල්බත්‍රාස වර්ගයේ දුවැන්ත පක්ෂියෙක් ඉක්තියැන්දර්ගේ හිස මතින් වෙරළ දෙසට පියාඹයි. හඬ නැඟෙන සේ ශක්තිමත් පියාපත් වේගයෙන් සලමින් උඹ ඉහළ යන විට කැලඹෙන වායුව පොඩිපහේ කුණාටුවක් මෙන් ඉක්තියැන්දර්ගේ මුහුණේ වදී. හේ ඉන් උද්දාමයට පත්වෙයි. අල්බත්‍රාසයාට රත්පැහැති හොටක් ද, තඹ පැහැති නිය පදුරු ද ඇත. අඩි දොළහක් පමණ දිග පිහාටුවල අඟලෙන් අඟලට වැටුණු වයිරම් ඇත. උඹ යන හැටි ඉක්තියැන්දර් බලා සිටියේ ඊර්ෂ්‍යාවෙන් තොරව නො වේ. තමාටත් මෙබඳු පියා පත් ලබා ගත හැකි නම් ඔහු ඒ වෙනුවට කැප නො කරන දෙයක් නැත.

ඈත බටහිර කඳුකරයට පිටුපසින් නිසා කත පසු බැස යයි. පෙර දිග අහස සෙමින් ළා රත් පැහැ ගනී. පෙනෙන නොපෙනෙන සිහින් රළ බිහි වේ. රන්වන් සිඟිති වයිරම් ලෙසින් දිස් වෙන රළ පෙළ පියාඹන මුහුදු ළිහිණියන්ගේ සේයා වැටෙන විට ළා රතට හැරේ.

මුදු මඳ පවන හමයි. මුහුද වැඩි වැඩියෙන් සසල වන විට ඒ මත ළා නිල්වන් රටා මැවෙයි. කෙමෙන් පවනේ වේගය වැඩිවෙයි. නිල් ගන නිලට හැරෙයි. දිය රැලි වෙරළ තවන විට දවසේ පළමු පෙණ පිඬු කහ පාට ය. වෙරළට නුදුරු ජලය කොළ පාටට හුරු ය.

රුවල් නැව් රැසක් හෙමිහිට ඇදෙනු පෙනෙයි. මිනිසුන් මගහරින්නට සිය පියතුමා දී ඇති ඔවා ඉක්තියැන්දර්ට සිහිවෙයි. හේ වහා දියෙහි කිමිදෙයි. ඔහුට යළි සීත දිය වැල හමුවෙයි. දිය වැල ඔහු වෙරළින් තවත් ඈතට ගෙන යයි. ගැඹුරෙහි වූ නො පැහැදිලි ළා නිල් දියෙහි රජයන රතු, නිල් සහ දුඹුරු වන් මස්සු රන් වන් සමනල රැනක් ලෙසින් පැන යති.

ගුරු ගුරු හඬක් ඉහළින් ඇසෙයි. මොහොතකට ජලය අඳුරු වෙයි. ඒ පහතින් යන මුහුදු ගුවන් යානයක් විය යුතු ය. වරක් මුහුදු ගුවන් යානයක් මුහුදට බස්සා තිබිය දී සිදු වූ අකරතැබ්බය ඔහුට තව ම මතක ය. යානය වඩා හොඳින් බලාගන්නට එය අසලට ම ගිය හේ ඉපියාවක් අල්ලාගෙන සිටියේ ය. හිටි හැටියේ යානය පිටත් වීය. ඉක්තියැන්දර් අඩි තිහක් පමණ ඉහළින් විසි වී ගොස් ජලයෙහි පතිත විය. ඔහු මරණයෙන් බේරුණේ අනූනවයෙනි.

මුහුද යට සිට උඩ බලන විට ඔහුට බොඳ වුණු ආලෝක ගෝලයක් වැනි සූර්යයා සිය හිසට කෙලින් තිබෙනු පෙනෙයි. දැන් මධ්‍යාහ්නය යි. සයුරු තලය තව දුරටත් සයුරු ගබ පිළිබිඹු කර පෙන්වන විශ්වාස දායක කැඩපතක් නො වේ. ගොදුරු සොයා යන ලොකු මසුන් සිටින ඉසව්ව ඉක්තියැන්දර් බලාගත්තේ මේ කැඩපතේ වහලෙනි. දැන් සයුර තලයට ළං වන විට ම මුහුදෙහි කැලඹිල්ල ඔහුට දැනෙයි. තව මොහොතකින් දියෙන් මතු වුණු හිස සහ දෙ උර ඇති හේ මහා තරංගයක සිරසට නඟී. යළි ඉන් බසී. යළිදු නඟී. බසී...... ඔහෝ සමුදුර කැලඹිලා, පබල ලෙස ගුගුරමින් මහ ගල්වලට පහර දෙමින්, මහ රළ වෙරළෙහි හැපි හැපී බිඳෙන විට පෙණ කැටි මතු වෙයි.

තියුණු නිරිත දිග සුළඟ රළ පෙළ කලඹමින් පෙණ පිඩුවල තුඩු සිඳිමින් හමන විට දිය කඳ කැලතී කහ - කොළ මුසු පැහැයක් ගනී. සුළඟ වරින් වර ඉක්තියැන්දර්ගේ මුහුණට ද දිය පොද ඉසී. හේ සොම්නසින් ඉපිලෙයි.

පියාමැස්සෝ රැන් ඉගිල යති. රළ මුදුන්හි ගැවෙමින් ද, රළ දෙකක් අතර සෑදෙන ඇඟිලියෙහි ද අඩි තිහ හතළිහක් රළ සමග පියාඹන ඔවුන් යළි ඉහළින් ඉගිළෙති. මුහුදු ලිහිණියෝ හඬමින් වේගයෙන් ඔබ මොබ සරති. ශීඝ්‍රතම මුහුදු පක්ෂියා පිගාතයා ය. පිගාතයෝ උන්ගේ පුළුල් පියාපත්වලින් වා තලය කපාගෙන යති. නැමුණු ලොකු තුඩ ද ශක්තිමත් නිය පඳුරු ද, තද දුඹුරු පියාපත් ද සහිත, කහ මුසු කොළ පාට බෙල්ල ඇති පක්ෂියා පිරිමි සතා ය. ඔහුගේ සහකාරිය පසු පෙදෙස සුදු පාටින් සහ ළා දුඹුරු පියාපත්වලින් යුතුව පසෙකින් සිටී. ඕ හිටි ගමන් ඊයක් මෙන් පහත් වී මොහොතකින් ඉහළ නඟී. ඇගේ හොටෙහි දඟලන රිදී පාට කොරපොතු සහිත මාළුවෙකි. ඉහළ අහසේ අල්බත්‍රාස පක්ෂීන් හැසිරීම කුණාටුවක් එන බවට නිසැක පෙරනිමිත්තකි.

ඊටත් ඉහළ උස් හඬින් කෑ ගැසීම ගැන නම් දරුණු නිර්භීත වැහි ලේන්නු කාල වර්ණ ගණ වලා හමු වීමට වේගයෙන් පියාඹති. කුණාටුවට අසු වීමට නො කැමැති මස් මරන්නෝ සිය හම්බන්වල රුවල් සියල්ල නගා වරායේ සරණ පතා මුළු වැරෙන් යාත්‍රා කෙරෙති.

පළාවන් සන්ධ්‍යා කාන්තිය රළ පෙළ මත පැතිරෙයි. වලා සහ මුහුද නැමැති ද්විත්ව ආවරණය මැදින් පෙනෙන සූර්ය බිම්බය අනුව උභයජීව කාලය මනී. ඔහු දවල් ආහාරයට ගන්නට නම් හිරු මඬල වලා අතර නො පෙනී යන්නට පෙර කාවාටි බිම් කරා ළඟ විය යුතු ය. හේ මැඬියකු මෙන් පීනා යයි.

අවට ඇති අඩ අඳුර තුළින් යා යුතු ඉසව්ව දැනගැනීමට ඉක්තියැන්දර් වරින් වර ආපසු හැරී බොඳ වූ හිරු එළිය දෙස බලයි. දියෙහි තතු සටහන් කරන්නා වූ ඔහුගේ කරමල් සහ හම ද යා යුතු මඟ සොයාගන්නට ඔහුට උදව් වෙයි. මහලු මුහුදු වෘකයකු තමාට පමණක් විෂය වන සලකුණුවලින් ගොඩබිමට ළඟා වීම දැනගන්නා ලෙස

ඉක්තියැන්ද්‍ර් ද මඟ සහතික කරගනී.

අන්තිමේ තමා යන මඟ දෙපසින් පිහිටි හුරු පුරුදු ගල් දඹවල සේයාව ඔහුට පෙනෙයි. ගල් වැටි දෙ පළ අතර සමතලා බිමකි. පිටුපස තව ගල් දඹයකි.

දරුණු ම කුණාටුවක දී පවා එහි නිසල බව රැකෙන නිසා ඉක්තියැන්ද්‍ර් එය තමාගේ දිය යට වරාය ලෙස සලකයි.

එය ඔහුට මෙන් ම මත්ස්‍ය සමූහයාට ද වරායකි. හොද්දක මෙන් එහි මාළු රැස්ව හිඳිති. විවිධ වර්ගවල කුඩා මත්ස්‍යයෝ එහි වෙති. වරෙක රංචු පිටින් පලායන ඔහු යළි ක්ෂණයෙන් වෙන පැත්තකින් මතු වෙයි.

දැන් ආහාර වේලාව ය. මුහුදු පත්ලේ සමතලා බිම් කඩෙහි කාවාටි සුලබ ය. වඩාත් සරු තැනෙක වාඩි ගන්නා ඉක්තියැන්ද්‍ර් අතට අසු වන පළමු වන බෙල්ලා විවෘත කරයි. තෝරාගත් අහර කැබලි ඔහුගේ මුවට යයි. දිය යට දී අහර ගැනීමට ඔහුට සුපුරුදු ක්‍රම ඇත. කෑම කටක් ගත් පසු අඩක් පියවුණු දත් අතරින් ජලය ඉබේ ම පිට වෙයි. ඔහුට ආහාරය සමඟ වතුර ස්වල්පයක් ද පෙවෙයි. එහෙත් එය ඔහුට පුරුදු ය. මේ ගැජුමක බොල් හඬක් දිය කඳ අතරින් විත් ඉක්තියැන්ද්‍ර්ගේ දිය යට නිවාසය වෙත කා වදී. හේ ඔහුගේ අහර කිස නිම වී ඇති හෙයින් දැන් ඔහුට එය පිරික්සා බැලිය හැකි ය. හේ රූරාගෙන ඉහළ නගී. සයුරු තලයට ළඟා වන ඔහුට දැවැන්ත අල්බත්‍රාස පක්ෂියෙකු අහසේ ඉහළ පහළ යනු පෙනෙයි. ඌ උගේ දෙපා ඉක්තියැන්ද්‍ර්ගේ අතට අසු වන මානයට එයි. හේ සැණෙන් අත් ඔසවා පක්ෂියාගේ දෙපා තදින් අල්ලා ගනී. වික්ෂිප්ත වූ පක්ෂියා ශක්තිමත් පියාපත් විදහා ඉක්තියැන්ද්‍ර් ඔසවාගෙන ම ගුවනට නැංගවිට ඔහුගේ බර නිසා ඌ ඇද වැටිණ. පක්ෂියාගේ සිරුරට යට වූ හෙතෙම ඌට සිය හිසට කොටන්නට ඉඩ නොදී දියේ ගිලී ගොස් ඈතින් මතු විය. අල්බත්‍රාසය සිය යෝධ පියාපත් සලමින් ඉගිලී ඈත කඳු වැටි අතරේ නො පෙනී ගියේය.

ඉක්තියැන්ද්‍ර් උඩුකුරු ව දිය මත පා වෙයි. මාරුතය පෙර දිගට හමාගෙන ගොස් ඇත. අහස ගුරුගුරු හඬින් ගුගුරුවයි. වැස්ස සෑම තැනම සම ව වසියි. හේ ප්‍රීතියෙන් ප්‍රමුදිත ව ඇස් අඩක අයා දිය මත වැතිර සිටී. පුළුල් රැලි ලෙසින් ඉහළ-පහළ යන දිය කඳ මත තාලයට පැද්දෙන හෙතෙම අවට මනා ව නැරඹීමට ඇස් හරී. තමා දැවැන්ත තරංග ශිඛාවක් මත පැළඹෙන බව හේ දකී. ආකාශය, සාගරය, මාරුතය සහ වර්ෂාව සමස්ත ජලීය වික්ෂෝභයක් (කැලඹීමක්) මෙන් සිය ආදිකල්පික ප්‍රචණ්ඩ භාවයෙන් ගර්ජනා කෙරෙයි. කුඩා පෙණ පිඬු රළ මුදුන්හි වෙවුලයි. දියෙහි නැග්ම සහ බැස්ම අනුව ඒවා රැලි සහිත මංවල ගමන් කරයි. මාරුතයේ පිම්බී එක පිට එක නඟින දිය කඳු කඩා වැටී යළි එක පිට එක නගී.

මිනිසාට බිය උපදවන දේ ඉක්තියැන්ද්‍ර්ට විනෝදය ගෙන දෙයි. සැබවින් ම මුහුදු රළ ඔහුට වුව ද භයානක විය හැකි ය. එහෙත් හේ මාළුවකු මෙන් එහි ස්වභාවය දනී. නොයෙක් විධියේ රළ ඇත. ඇතැම් රළක් එයට අසු වූවන් ඉහළ පහළ යවනු ඇත. තවෙකක් ඊට අසු වූවන් ඔසවා ඉවත දමා ගසනු ඇත. සුළඟ හමාර වූ පසු රළ අතුරුදහන් වන සැටිත් රළ පෙළට යටින් ඇති මුහුදු ජලයේ ප්‍රතික්‍රියාත් හේ දනී.

කුණාටුව නැවතුණ පසු ද මාරියාව බොහෝ වේලා පවතී.

වැස්ස පායා ඇත. වැහි කෝඩ කුණාටුව විසින් පෙරදිගට ගසාගෙන ගොස් ඇත. උතුරින් ගලා එන තද සුළං රැලි නිසා සුළඟ හමන අත ද වෙනස් වී ඇත.

වලා පැතිරුණු අහසෙයි පළින් පළ ඇති නිල්වන් කොටස් අතරින් හිරු සිය රැස් පොදි එවයි. තවම අඳුරු පැහැය නො ගිය ගිනිකොන අහසෙහි ද්විත්ව දේදුන්නක් පායා ඇත. උමතුව පහ ව ගොස් සයුර සන්සුන් වී ඇත. දැන් එය හිරු රැස් වැදී බබළන නිල්වන් මනහර ජල තලයකි.

එක මොහොතක දී හිරු විසින් අහස, සයුර, වෙරළ, ඈත කඳුකරය ඇතුළු සියල්ල නො සිතිය හැකි තරමින් වෙනස් කර ඇත. කුණාටුවෙන් පසු වායුව කොතරම් සුව දායක ද? ඉක්තියැන්ඳර් දැන් මේ ජීවදායක වායුව ශ්වසනය කරයි. වරක් ගිජු ලෙස පෙනහලු පුරා හුස්ම ගනී. වරක් කරමල අතරින් හුස්ම ගනී. කුණාටුවකින් පසු මුහුදු ජලයට ඔක්සිජන් බෙහෙවින් මුසු ව ඇති බැවින් මස්සු සහ මුහුදු සත්තු නම් එය මැනවින් දනිති.

කුණාටුවකින් පසු මුහුදු පත්ලේ ගල් පරවල ඇති විවර, කොරල් පඳුරු සහ මූදු හතු ආදියෙහි ලැගුම් ගෙන සිටි සිඟිති මස්සු ඉන් පිට ව වඩා ලොකු මසුන්ගේ ගොදුරු බවට පත් වෙති; ඉක්තියැන්ඳර්ට නුදුරෙහි පෙම් කෙළිති. නාසයෙන් පිඹිමින් එකනෙකා පසුපස හඹා යන විට කළු පාටින් ඔප් නැගුණු සිරුරුවලට හිරු රැස් වැදි දිලිසෙයි. මේ සයුර මේ ඩොල්පින්හු - මේ අහස සහ හිරු යන සියල්ල උදක් තමාගේ ප්‍රමෝදය සඳහා මවා ඇතැ යි ඉක්තියැන්ඳර්ට සිතෙයි.

හෙතෙම හිස ඔසවා අඹරවා හිරු දෙස බලයි. එය අහසේ පැළ දිග ය. සැන්දෑව නුදුරු ය. එහෙත් අද නම් කල් ඇති ව ගෙදර යන්නට ඔහුට නො සිතෙයි. අඳුරු අහසෙයි පළමු තරුව දිස් වන තුරු ම තරඟ මත පැද්දී නැළවෙන්නටයි ඔහුගේ රිසිය.

එහෙත් මේ රස්තියාදුව ඔහුට ඉක්මනින් තිත්ත වෙයි. ඒ මොහොතේ වැල්ලේ වැනසී යන කුඩා මුහුදු සත්තු ඔහුට සිහි වෙයි. හේ ඈත පෙනෙන වෙරළ දෙස බලයි. ඔහුගේ උපකාරය සැබවින් ම අවශ්‍ය වන්නේ එතැනට ය. මුහුදු රළ විනාශකාරී වී ඇත්තේ එහි ය.

කුණාටුවකින් පසු විවිධ පැළෑටි සහ මුහුදු සත්තු වැල්ලට ගොඩ ගසනු ලැබෙති. කකුළුවෝ, ජල්ලියෝ, පසැගිල්ලෝ සහ වෙනත් මත්ස්‍යයෝ ඇතැම් විට අපරීක්ෂාකාරී ඩොල්පිනයෙක් පවා ඔවුන් අතර වෙති. ජල්ලියෝ ඉක්මනින් වැනසී යති. එහෙත් කුඩා මස්සු ඇඹරෙමින් ද, කරණම් ගසමින් ද, ආපසු මුහුදට යන්නට තැත් කරති. බොහෝ කකුළුවෝ ද එසේ කරති. සමහර කකුළුවන් නම් වැල්ලටත් එන්නේ අමාරුවේ වැටුණු සතුන් ගොදුරු කරගන්නට ය. කුණාටුවෙන් විපතට පත් වූවන් බේරාගැනීමට යන්නැයි ඉක්තියැන්ඳර්ගේ සානුකම්පිත හදවත ඔහුට කියයි. මුදාගන්නට තවම කල් ඉකුත් නුවූ මසුන් සොයමින් හෙතෙම පැ ගණන් වැල්ලේ හැසිරෙයි. අසරණ ව සිටින මසුන් අල්ලා දියට දැමූ විට උන් වරල් ලෙළවමින් පීනා යන හැටි දැකීමෙන් හේ අපමණ සොම්නසින් පිනා යයි. එසේ දැමූ විට හේ සිනා මුහුණින් යුතු ව උෟ බදාගෙන සැනසිලි වදන් කියමින් මුහුද කරා ගෙන යයි. සැබවින් ම මුහුදේ දී බඩගිනි වූ වේලාවක නම් මේ මසුන් ඔහු

විසින් ගිල දමනු ලැබිය හැකි ය. එහෙත් එය අවශ්‍යතාව නිසා සිදු වන නපුරකි. දැන් මේ වැල්ලේ අනාථ වූ ප්‍රාණීන්ගේ විමුක්තිදායකයා ඉක්තියැන්දර් ය.

සිරිත් පරිදි ඉක්තියැන්දර් ආපසු යන්නේ ඔහු ආ හැටියෙන් ම මුහුද යටින් ගලායන දියවැලේ වහලින් ය. එහෙත් අද හේ එතෙක් දුර මුහුද යටින් යන්නට කැමැති නැත. සයුර සහ අහස ඒ තරම් මනහර ය. හේ දිය කාවකු මෙන් දියෙහි කිමිදෙයි. දිය යටින් යයි. මතුවෙයි.

සැඳෑ හිරුගේ අවසන් රැස් නිවී ඇත. බටහිර ක්ෂිතිජයේ කාෂාය වර්ණය ක්ෂය වී ඇත. අන්ධකාර ඡායාවෝ එකිනෙකා ලුහු බඳිති.

සයුරු තලයට මඳක් පහළින් දකුණු දිගට ගලා යන උණුසුම් දිය වැල ඉක්තියැන්දර්ට හමු වේ. මේ ඔහුට දැන් උවමනා දෙයයි. දහවල් මුහුදේ නඟින දිය තරඟ නිසා මේ දියවැලෙහි ද හෙමිහිට උස් පහත් වීමක් ඇත. ඊටත් පහළින් උතුරු දිගට ගලන සීත දිය වැලකි. තමාගේ වෙරළාසන්න ගමන්වල දී මේ දිය වැල් දෙකින් ම අවස්ථානුරූප ව ප්‍රයෝජන ගන්නට හේ දනී. තරඟ නිසා මේ දියවැලෙහි ද හෙමිහිට උස් පහත් වීමක් ඇත. ඊටත් පහළින් උතුරු දිගට ගලන සීත දියවැලකි. තමාගේ වෙරළාසන්න ගමන්වල දී මේ දිය වැල් දෙකින් ම අවස්ථානුරූප ව ප්‍රයෝජන ගන්නට හේ දනී.

උණුසුම් දියවැල ඔහු නිවස වෙත ගෙන යනු ඇත. ඔහුට ඇත්තේ උමං කටින් ඔබ්බට නො යන පරිදි අවදියෙන් සිටීම පමණකි. සරඹ කරන විටෙක මෙන් දෑත් දෙ පසට විහිදමින් සහ අකුළමින් ද පා දෙපසට විහිදමින් සහ එක් කරමින් ද තමා දකුණු පසට ගෙන යාමට හෙතෙම දිය වැලට රුකුල් දුන්නේ ය. උණුසුම් ජලය ද, මන්ද ව්‍යායාමය ද ඔහුට සුව දායක විය.

ඉක්තියැන්දර් උඩ බලන විට දූලි කැට වැනි සිහින් තරුවලින් ගහන අහසක් පෙනේ. ඒ තමන්ගේ සිඟිති පහන් දල්වාගෙන සයුරු තලයට නඟින මුහුදු කණාමැදිරියන් විය යුතු ය. අවට අඳුරේ තැනින් තැන නිලට සහ ළා රතට දිලිසෙන තාරකා රාශීන් වැනි වටකුරු සත්තු හෙමින් පාවෙති. විසිතුරු ලෙස ගෙත්තම් කළ වාටිය සහිත පහන් වැස්මක් යෙදූ පහනක් මෙන් ඉක්තියැන්දර් ළඟින් ම ආලෝකය විහිදුවමින් යන්නේ ජල්ලියෙකි. ජල්ලියාගේ සැම චලනයක් පාසා ම මඳ සුළඟකින් මෙන් පහන් වැස්මෙහි වාටිය සෙලවෙයි.

නො ගැඹුරු දියෙහි පසැඟිල්ලන් දනට ම පහන් දල්වා ඇත. වඩා ගැඹුරෙහි ගොදුරු අල්ලා කන ලොකු මසුන්ගේ එළි ඔබ මොබ දුවනු පෙනේ. උහු එකිනෙකා පසු පස එලවා රවුම් ගසති. නිවී යති, යළි දල්වෙති. තව ද නොගැඹුරු දිය කඩකි. විස්මය දනවන සුලු කඳන් සහ අතු සහිත ගල් මල්, නිල්, මඳ රතු පච්ච සුදු පාටට ඇතුළතින් බබළයි. ඇතැම් ගල් මල් නිවී පත්තු වෙයි. අනෙක්වා ගිනියම් වූ යවට සේ දිලෙයි.

ගොඩබිම දී රෑට අහසෙහි කුඩා තරු ද, ඇතැම් විට සඳ ද දැක්ක හැකි ය. මුහුදේ දී දහස් ගණන් තරු ද, දහස් ගණන් චන්ද්‍රයෝ ද, දහස් ගණන් විවිධ වර්ණවත් සූර්යයෝ ද දැකිය හැකි වෙති. ඔහු සියල්ලෝ මන්දාලෝකය විහිදුවති. සාගරයෙහි රාත්‍රිය ගොඩ බිමට වඩා අපරිමිත ලෙසින් අලංකාර ය.

සසඳා බැලීම සඳහා හේ නැවත සයුරු තලය මතට එයි.

වායුව වඩා උණුසුම් ව ඇත. තැන තැන තරු ඔබ්බන ලද ගණ නිල් අහස ඉහළින් පෙනේ. රිදීමය හඳක් ක්ෂිතිජයෙන් මතු වෙයි. සමුදුර හරහා රිදීමය පාරක් දිස්වෙයි.

ඈත වරාය දෙසින් සිහින් හූ හඬක් දිගට ම ඇසෙයි. ඒ ආපසු ගමන් අරඹන්නට සැරසෙන හොරෙක්ස් නැවේ හඬ ය. හා! පමාවුණා වැඩියි. අරුණෝදය ළඟයි. පැ විසි හතරකට කිට්ටු කාලයක් ගෙවී ඇත. පියා ඔහුට බණිනු සිකුරු ය.

ඉක්තියැන්දර් උමඟ දෙසට යයි. යපොලු අතරින් අත් යවා ග්‍රීලය හැර තද අඳුරේ පීනයි. දූන් හේ මුහුදින් පොකුණු කරා දිය ගෙන යන සීතල දිය වැලේ ය.

යන්තමින් උරහිසට වැදුණු පහරකින් ඉක්තියැන්දර් පිබිදෙයි. දූන් හේ තටාකයේ ය. සැණෙන් උඩට එන හෙතෙම සුපුරුදු මලින් සුවඳවත් වූ ප්‍රණීත වායුව පෙනහලු පුරා ආශ්වාස හා ප්‍රශ්වාස කරන්නට පටන් ගනී.

## අරුත් පැහැදිලි කිරීම්

| | |
|---|---|
| ඉක්තියැන්දර් | ජලචර මානවයා (ඉක්තියැන්දර් යනු මත්ස්‍යා ද මනුෂ්‍යයා ද හඳුන්වන ග්‍රීක වචනයකි.) |
| උභයජීව | දියගොඩ දෙකෙහි ම ජීවත්වන |
| ග්‍රීලය | දැල් කවුළුව |
| යපොලු | යකඩ පොලු |
| සයිරනය | සයිරන් නලාව |
| ක්ෂුද්‍ර පීඩනය | කුඩා පීඩනයක් |
| පිගාතයා | ගොදුරු සොයා කන සර්ම කලාපීය පක්ෂියෙකි. |
| හම්බන් | කුඩා ඔරු විශේෂයක් |
| ගල්දඹ | ගල් කුළුණු |
| කෙළි යහළුවන් | එක්ව ක්‍රීඩාකරන්නන් |
| ඇළපත | ඉළ පෙදෙස |
| බඩවත | බඩ පෙදෙස |

## ක්‍රියාකාරකම 01

i. තටාකයේ පහළට ගොස් උමගේ මඟ සොයා ගැනීම සඳහා ඉක්තියැන්ඩ්‍රර්ට උපකාරී වූයේ මොනවා ද?

ii. ඉක්තියැන්ද්‍රර්ට ශ්වසනයේ මඳ අපහසුවක් ඇති වූයේ කුමන ඉසව්වක දී ද?

iii. නින්දේ දී පවා ඉක්තියැන්ද්‍රර් ශීත, උෂ්ණ හා පීඩන වැනි තත්වයන්ගේ වෙනස්කම් හඳුනාගන්නේ කෙසේ ද?

iv. මුහුදු ජලයේ ශබ්ද තරංග ගමන් කරන වේගය කුමක් ද?

v. මුහුදේ දී ඉක්තියැන්ද්‍රර් මුහුණ දී ඇති අවදානම් අවස්ථා දෙකක් සඳහන් කරන්න.

vi. ඉක්තියැන්ද්‍රර් දිය යට වරාය නැමැති ස්ථානය වැදගත් කොට සැලකුවේ ඇයි?

vii. මිනිසාට බිය උපදවන දේ ඉක්තියැන්ද්‍රර්ට විනෝදය ගෙන දේ. මේ අදහස විස්තර කරන්න.

viii. ඉක්තියැන්ද්‍රර් විපතට පත් ප්‍රාණීන්ට උදව් කළ ආකාරය පැහැදිලි කරන්න.

ix. මේ යෙදුම්වල අර්ථය පැහැදිලි කරන්න.

- * තාමත් නින්දේ උණුසුම නොගිය කොපුල් තෙමෙයි.
- * මාරුතයෙන් පිම්බී එක පිට එක නඟින දිය කඳු.
- * ඔප් නැඟූ කැඩපතක් බඳු ජල තලයෙහි.
- * බලවත් ලෙස ගුගුරමින් මහ ගල්වලට පහර දෙමින් මහ රළ වෙරළෙහි හැපී බිඳෙන විට.
- * බටහිර ක්ෂිතිජයේ කෂාය වර්ණය ක්ෂය වී ඇත.

## ක්‍රියාකාරකම 02

1. පාඩමේ එන පහත සඳහන් වචනවල අදහස පැහැදිලි වන සේ එම වචන යොදා වාක්‍ය තනන්න.

i. ප්‍රතික්‍රියා

ii. ද්විත්ව

iii. අපරිමිත

iv. ක්ෂිතිජය

v. ප්‍රමෝදය

vi. අනාථ

vii. සුරක්ෂිත

viii. වික්ෂිප්ත

2. සමාන පද ලියා පහත වගුව සම්පූර්ණ කරන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| අලුයම | | පිවිසෙයි | | වටකුරු | |
| සයුර | | ක්ෂුද්‍ර | | චලනය | |
| පිනි | | විවේකය | | විස්මය | |
| වායුව | | පබල | | ඉසව්ව | |
| මඳක් | | සොම්නස | | ගුවන | |

3.වැරදි වචනයට යටින් ඉරක් අඳින්න.

(අ) (i) පිහිනුම් (ii) වැටුණු (iii) උනුසුම් (iv) උෂ්ණ

(i) සීඝ්‍රතාව (ii) වික්ෂිප්ත (iii) ප්‍රචණ්ඩ (iv) වික්ෂෝභය

(i) සුඛෝපභෝගී (ii) ශබ්ධය (iii) නෞකාව (iv) ග්‍රහණය

(i) සූර්යයා (ii) සමාජ අධ්‍යනය (iii) ප්‍රදර්ශනය (iv) විශ්වාස

(i) සුරක්ෂිත (ii) කුණාටුව (iii) අනාත ප්‍රාණීන් (iv) ව්‍යායාමය

## ක්‍රියාකාරකම 03

(1) සුදුසු සමූහාර්ථවාචී පද තෝරාගෙන වාක්‍ය සම්පූර්ණ කරන්න.

(i) ධීවර ............................................................... ඈත දියඹට ඔරු පැදවූහ.

(ii) මින් ............................................................... වෙරළට ඇදෙති.

(iii) භට ............................................................... මුහුදේ සෝදිසි මෙහෙයුම් දියත් කළහ.

(iv) අහසෙහි තාරකා ............................................................... දීප්තිමත් ව බබළන්නට විය.

(v) මුහුදේ සිට බලන විට ඔරු ............................................... ඈතින් පෙනෙන්නට විය.

## පැවරුම

(1) නිශ්ශබ්ද ව පාඩම කියවන්න.

(2) පාඩමේ ඔබ සිත් ගත් අවස්ථාවක් කණ්ඩායම් වශයෙන් සාකච්ඡා කරන්න.

(3) ඉක්තියැන්දර් දවස ගත කළ ආකාරය කෙටියෙන් පන්තියට ඉදිරිපත් කරන්න.

(4) ඉක්තියැන්දර් චරිතයේ කැපී පෙනෙන චරිත ලක්ෂණ කිහිපයක් ලියන්න.

(5) "අසිරිමත් මහ සයුර" මැයෙන් රචනයක් ලියන්න.

(6) මුහුද පිළිබඳ ලියැවුණු ලිපි හා නිර්මාණ එකතුවක් සකස් කරන්න.

(7) පිටසක්වලින් ජීවීන් පැමිණීම දක්වෙන සිදුවීමක් පුවත්පත් වාර්තාවක් ලෙස සකස් කරන්න.